**ශීර්ෂය 303 - පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------

### 1.1 මතය

--------

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පේෂකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 11.1 ඡේදය | භාණ්ඩ සමීක්ෂණයට අදාළව පොදු 47 වාර්තාවේ සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම ඉදිරි මුදල් වර්ෂයේ අප්‍රේල් 30 ට පෙර සිදු කළ යුතු වුවත් 2020 හා 2021 වර්ෂයන්ට අදාළව හඳුනාගත් භාණ්ඩ අපහරණය 2022 අප්‍රේල් 30 වන විටද සිදු කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ වර්ෂයේදීම භාණ්ඩ සමීක්ෂණ තීරණ අනුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම සිදු කළ බව. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 | ආයතනයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්පෝට්‍රල් ජනරාල් වෙත වාර්තා කළ යුතු වුවත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සතු ඉඩම් සහ ගොඩනැඟිලි 6 ක වටිනාකම වූ රු.227,537,975 පමණක් එසේ වාර්තා කර තිබුණු අතර ඉතිරි ගොඩනැඟිලි 12 හා ඊට අයත් ඉඩම් වටිනාකම තක්සේරු කර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි. | වාර්තා නොකළ ගොඩනැගිලි 12 ක් හා ඊට අයත් ඉඩම් වල වටිනාකම් තක්සේරු කළ පසු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කරන බව | චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු කොම්පෝට්‍රල් ජනරාල් වෙත වාර්තා කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පේෂකර්ම අත්යන්ත්‍ර සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමේ නව්‍යකරණ ව්‍යාපෘතිය යටතේ, කටුබැද්ද පේෂ පාසැලේ අත්යන්ත්‍ර රජයේ කර්මාන්ත ශාලාවේ අධීක්ෂණය යටතේ නවීකරණය සඳහා රු.මිලියන 7ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වෙන්කර තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තාව අනුව ඒ සඳහා රු.185,137 ක් වැයකර එක් යන්ත්‍රයක් පමණක් නවීකරණය කර තිබුණි . | නව්‍යකරණ වැඩසටහන යටතේ අත්යන්ත්‍ර නවීකරණය ස්වයංක්‍රියව ක්‍රියාත්මක වන වෝපින් සෙට්, ඉලෙක්ට්‍රොනික් වයින්ඩින් මැෂින්, IDB මඟින් හඳුනාගත් යන්ත්‍රය ක්ෂේත්‍රයට හඳුනා දීමේ වැඩසටහන මේ යටතේ දියත් කිරීමට නියමිතව තිබුණි. කොවිඩ් හා රට හුදකලා කිරීමේ තත්ත්වය මත අදාළ ආයතන හා පුද්ගලයින් සම්බන්ධීකරණය හා ඉදිරි වැඩපිළිවෙල දිගින් දිගටම ක්‍රියාත්මක කිරීම අක්‍රීය විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පේෂකර්ම ගම්මාන **10** ක් පිහිටුවීම සඳහා ඒ ආශ්‍රිතව අයදුම්කරුවෝ **150** දෙනෙකු පුහුණු කර අවශ්‍ය උපකරණ ලබාදීමට සැලසුම්කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ගම්මාන **5** ක් ආශ්‍රිතව අයදුම්කරුවන් **73** දෙනෙකු සඳහා පුහුණුව ලබාදී තිබූ අතර එම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.**24,676,250** ක් වටිනා අත්යන්ත්‍ර ආශ්‍රිත උපකරණ **2022** අප්‍රේල් **30** දින වන විටත් ගබඩාවේ රඳවා තිබුණි. | 2021 වර්ෂයේ දී ව්‍යාපෘති 10ක් ආරම්භ කිරීමට සැලසුම් කරන ලද නමුත් පැවති කොවිඩ් වසංගතයේ තුන්වන ව්‍යාප්තිය මත බලාපොරොත්තු වූ ව්‍යාපෘති සියල්ල ආරම්භ කළ නොහැකි වූ අතර සීමිත පිරිසක් පුහුණුවට යොදා ගැනීමට සිදු විය.<br><br>2020 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති අවසන් වූ පසු අදාළ උපකරන ව්‍යාපෘති සඳහා බෙදා දීමට කටයුතු කරන බව හා ඉතිරි අත්යන්ත්‍ර ප්‍රමාණය ආරම්භ කර ඇති ව්‍යාපෘති සඳහා නැවත මිළදී ගැනීමකින් තොරව භාවිතා කිරීමට කටයුතු කරන බව. | ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සැලසුම් කළ වැඩසටහන් නියමිත ලෙස ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | පූර්ණ සේවා නියුක්තිය තුළින් දළ ජාතික නිෂ්පාදිතයට වන දායකත්වය ඉහළ නැංවීම සඳහා වෘත්තීය සුදුසුකම් සහිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම දෙපාර්තමේන්තුවේ ජාතික කර්තව්‍ය වුවත් පේෂ පාසැල් වල ක්‍රියාත්මක වන සය මාසික මූලික පාඨමාලාව, පේෂකර්මාන්ත අවසාන සහතික පත්‍ර පාඨමාලාව සහ අත්යන්ත්‍ර කර්මාන්ත උසස් මෝස්තර | අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාළව පුහුණු කටයුතු සිදුකිරීම වෙනුවෙන් වෘත්තීය සුදුසුකම් ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක වෙමින් පවතින අතර වාර්ෂිකව පැමිණෙන සිසුන් ඇගයීම් කටයුතු සඳහා යොමු කිරීම සිදු කරන අතර එම සුදුසුකම් ලබාදීමේ වැඩපිළිවෙල අඛණ්ඩව සිදුවන බව. | ආයතනය විසින් සිදු කරනු ලබන මෙම පාඨමාලා සඳහා වෘත්තිය වශයෙන් පිළිගත් **(NVQ)** අදියර **4** දක්වා සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. |

පුහුණු පාඨමාලා සඳහා වෘත්තිය වශයෙන් පිළිගත් (**NVQ**) අදියර **4** දක්වා සංවර්ධනය කිරීම සමාලෝචිත වර්ෂයේදීද සිදුවී නොතිබුණි.

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | බාහිර පාර්ශවයන්ට බදු දී තිබූ දෙපාර්තමේන්තුවට අයත් බලවේග පේෂකර්ම ආයතනවලින් ආයතන 04 ක් බදු ගිවිසුම කඩකර වසර 3ත් වසර 22 ත් අතර කාලය තුළ කිසිදු මුදලක් ගෙවා නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම බදුකරුවන්ගෙන් අය විය යුතු බදු මුදල් ප්‍රමාණය රු.13,868,250 ක් වී තිබුණි. ඉන් එක් බදුකරුවෙකු බදු දේපළ ඇපයට තබා ණය මුදලක්ද ලබාගෙන ඇති අතර රු.8,910,000 ක බදු ගෙවීම් පැහැර හැර තිබුණි. තවත් බදු දේපළකින් රු.2,756,000 ක් අයවිය යුතු අතර දැනට අනවසරයෙන් අයෙකු පදිංචිවී ඇත. එක් ආයතනයකින් අයවිය යුතු හිඟ බදු රු.521,000 ක් සම්බන්ධයෙන් බේරුම්කරණය වෙත යොමු වී නොතිබුණි. මේ අනුව හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතු වුවද එසේ කර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීති උපදෙස් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇති අතර අදාළ උපදෙස් අනුව ආයතනය කටයුතු සිදු කරනු ලබයි. | හිඟ කුලී අයකර ගැනීමට අදාළ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | පේෂකර්මාන්ත පුහුණු ආයතන ලෙස දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ගොඩනැඟිලි 5 ක් සහිත ඉඩම් කොටස් 3 ක අයිතිය නිවැරදිව හඳුනාගෙන නොමැති බැවින් එය නිරවුල් කර ගැනීමට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට හා දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය වෙත ඉල්ලීම් කර ඇතත් ඉන්පසු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති ඉඩම් සහ ගොඩනැඟිලි නිරවුල් කිරීමට අදාළ අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර පිළිතුරු ලැබීමෙන් පසු ඉදිරියේදී විගණනය දැනුවත් කිරීමට කටයුතු කරන බව . | ඉඩම්වල අයිතිය නිවැරදිව හඳුනාගෙන ගොඩනැඟිලි ඉදිකිරීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අයිතිය නිවැරදිව හඳුනාගෙන නොතිබූ ගොඩනැගිලි 2 ක් හා මුර කුටියක් සහිත රාජගිරියේ පර්චස් 30 ක ඉඩමේ පිහිටි ස්වාභාවික වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානය පාඨමාලා පැවැත්වීමට ප්‍රමාණවත් සිසුන් නොමැති නිසා 2021 වර්ෂයේ ජනවාරි සිට කොවිඩ් මධ්‍යස්ථානයක් ලෙස භාවිත කිරීමට තාවකාලිකව වෙනත් රාජ්‍ය ආයතනයකට ලබාදී තිබුණි. එසේ වුවද එම ගොඩනැගිල්ල දැනට අදාළ කාර්යය සඳහා භාවිත නොවන බැවින් එය නැවත ලබාගෙන ඵලදායීව යෙදවීමට කටයුතු කර නොතිබුණි. | පාඨමාලා පැවැත්වීමට ප්‍රමාණවත් සිසුන් නොමැති පැවති අතර කොවිඩ් 19 වසංගත සමයේ නිරෝධායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා වැලිකඩ පොලිස් ස්ථානයේ ඉල්ලීම පරිදි පොලිස් ස්ථානය වෙත ලබා දී ඇත. | එම ගොඩනැගිල්ල අදාළ කාර්යය සඳහා වර්තමානය වන විට භාවිත නොවන බැවින් එය නැවත ලබාගෙන ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------------- | ----------- |
| (අ) | දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වූ ප්‍රමාදය, තිරසර සංවර්ධන අරමුණු වල සාධනීය මට්ටම කෙරෙහිද අහිතකර ලෙස බලපා තිබුණි. එමෙන්ම එම අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්වය පාදක දත්ත ලෙස හඳුනාගෙන තිබිය යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේ ලබාගත් ප්‍රගතිය සියයට 0 ත් සියයට 49 ත් අතරවන බව වාර්ෂික කාර්යය සාධන වාර්තාවේ දක්වා තිබුණි. ඒ අනුව එම ප්‍රගති අගයන්හි නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි විය. | පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත සැලසුම් කල ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක නොවුණි. මෙම තත්ත්වය මත 2021 වර්ෂයේ සිදුකළ වැඩසටහන් ප්‍රමාණය මත වාර්ෂික කාර්ය සාධනයේ ප්‍රතිශතය හඳුනාගැනීමට කටයුතු කර ඇත. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනබැලීමට පාදක වර්ෂයක් හා එම වර්ෂයේ පැවති තත්වය පාදක දත්ත ලෙස හඳුනාගෙන තිබිය යුතුය. |
| (ආ) | 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ගික කළමනාකරණ සැලැස්මකට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ළඟාකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු පත්කර නොතිබුණි. | අදාළ නම් කිරීම ඉදිරියේදී සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල විය යුතුය. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **2008** පෙබරවාරි **06** දිනැති අංක **05/2008** හා **05/2008 (i)** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම හා අදාළ කටයුතු ඇගයීම් කිරීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | පැවති කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සකස් කිරීමේ කටයුතු අපේක්ෂිත පරිදි අවසන් කිරීමට නොහැකි වුවත් මේ වන විට එම කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමින් ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 5.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) පරිදි ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතුය. එසේ නොමැතිවිට පනතේ 40(2) පරිදි පනත ක්‍රියාත්මක වූ දින සිට වර්ෂ 2 ක් ඇතුළත එම තනතුර සඳහා පත්කිරීම් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදීද අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබීම හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | නිලධාරියෙකු ලබා දෙන ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලා ඇත. තවද එම තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු පත්කරන තෙක් රාජකාරි ආවරණය කිරීම සඳහා සුදුසු නිලධාරියෙකු ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) පරිදි අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතුය. |